---

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය - 2012**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) ප්‍රකාරව, වටිනාකම සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද එහෙත් වර්තමානයේදී භාවිතයේ පවතින වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අපනයන ප්‍රවර්ධන වැඩසටහන් හා විවිධ සැපයුම් සේවාවන් 15 ක් වෙනුවෙන් 2012 වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී රු.5,452,001 ක් වූ අත්තිකාරම් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට සේවාවන් ලැබී තිබුණද, එම අත්තිකාරම් පියවීම් කර අදාල වියදම් ගිණුම් ගත කිරීම වෙනුවට සාවද්‍ය ලෙස 2012 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ එම වියදම් අත්තිකාරම් ලෙස දක්වා තිබුණි.

(ආ) විදේශ ගමන් ණයගැති ගිණුම් ශේෂ එකතුව තුළ රු.687,613 ක් වූ අසාමාන්‍ය බැර ශේෂ හා ඌව පරණගම අපනයන සැකසුම් ගම්මාන නිෂ්පාදන විකුණුම් පාලන ණයහිමි ගිණුමේ එකතුව තුළ වූ රු.10,403,683 ක් වූ අසාමාන්‍ය හර ශේෂ නිරවුල් නොකර පැවතුණි.

1.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 07 කට වැඩි කාලපරිච්ඡේදයක් තුළ සමුච්චිත වී තිබුණු රු.104,619,993 ක් වූ යෙදවුම් එකතු කළ අගය මත බදු (VAT) ශේෂ නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 06 කට වැඩි කාලයක සිට ගෙවිය යුතුව තිබුණු වගකීම් ගිණුම් 02 ක එකතුව රු.3,117,992 ක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) වර්ෂ 02 සිට 15 දක්වා කාලයක් තුළ ගිණුම්වල සමුච්චිත වී තිබුණු රු.6,011,195 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂ නිරවුල් කර නොතිබුණි.

1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් සපයා ඇති තහවුරු කිරීම්, සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය/සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|
| | රු. | |
| පෞද්ගලික සමාගම් කොටස් විෂයයෙහි කළ ආයෝජන | 502,491,361 | (i) ආයෝජන සහතික<br>(ii) තොරතුරු ඇතුලත් ලිපිගොනු |
| අපනයනකරුවන්ගෙන් ලැබිය යුතු ණය | 46,486,856 | (i) ණය ලේඛන /ලෙජර<br>(ii) තොරතුරු ඇතුලත් ලිපිගොනු<br>(iii) පැවැත්ම තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි |
| විවිධ ණයගැතියන් | 13,256,823 | (i) ණය ලේඛන /ලෙජර |

විවිධ ණයහිමියන් 14,537,197 (ii) ශේෂ තහවුරු කිරීම්

1.2.5 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 2 (1) වගන්තිය | අපනයන සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික සංවර්ධන සභාව 1992 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ වර්ෂ 20 ක් තුළදී රැස්වී නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ.388 හා 389 | ලියන ලද චෙක්පත් නොපමාව ආදායකයාට භාරදීමට කටයුතු කළ යුතු වුවත්, වටිනාකම රු.22,687,471 ක් වූ චෙක්පත් 42 ක් එසේ භාර දීමට කටයුතු නොකර මාස 02 සිට මාස 08 දක්වා වූ කාලයක් නිලධාරීන් භාරයේ රඳවා ගෙන තිබුණි. |
| (ii) මු.රෙ.396 | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකල මාස 06 කට වැඩි කාලයක් ඉකුත් වූ වටිනාකම රු.2,957,542 ක් වූ චෙක්පත් 16 ක් සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) මු.රෙ.756 | වටිනාකම රු.170,328,607 ක් වූ ස්ථාවර වත්කම් 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වාම සමීක්ෂණය කර නොතිබුණි. |
| (iv) මු.රෙ.1645 | මණ්ඩලය සතු වාහන 28 කට අදාලව වාහන ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන ජාතික අයවැය චක්‍රලේඛය | මණ්ඩලයට අවශ්‍ය වාහන මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගත යුතු වුවද, ඊට පටහැනිව වර්ෂ 05 ක කාලයක් සඳහා බදු කුලියට වාහන 04 ක් ලබාගෙන 2012 දෙසැම්බර් 31 දින වන විට රු.8,680,568 ක් බදු කුලී වශයෙන් ගෙවා තිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

### 1.2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතට සහ අනුමත කාර්ය මණ්ඩලයට අනුව, මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ තනතුරක් නොමැති වුවත් ඊට පටහැනිව විධායක අධ්‍යක්ෂවරයෙකු පත් කර 2012 දෙසැම්බර් 31 දිනට මාසික දීමනා, ඉන්ධන දීමනා හා දුරකථන ගාස්තු වශයෙන් එකතුව රු.1,557,337 ක් මණ්ඩලයේ අරමුදලින් ගෙවා තිබුණි.

### 1.2.7 අරමුණුවලින් බැහැර ගනුදෙනු

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 12 වගන්තියේ දැක්වෙන මණ්ඩලයේ කාර්යයන් වලින් බැහැරව හා විධිමත් අධිකාර බලයකින් තොරව 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ලබා ගැනීමේ කටයුතු සංවිධානය, ක්‍රීඩා කටයුතු සංවර්ධනය හා ප්‍රවර්ධනය උදෙසා පිහිටුවා තිබුණු පෞද්ගලික සමාගමක කොටස් මිලදී ගැනීම වෙනුවෙන් රු. මිලියන 8 ක් 2011 වර්ෂයේදී ආයෝජනය කර තිබුණි. කෙසේවෙතත්, පොදු රාජ්‍ය මණ්ඩලීය

ක්‍රිඩා උළෙලේ සත්කාරකත්වය නොලැබීම මත 2011 දෙසැම්බර් 31 දින වනවිටත් මෙම සමාගමේ කටයුතු අක්‍රීය වී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.32,056,755 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් කටයුතුවලින් රු.19,489,522 ක ඌනතාවක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.12,567,233 ක පිරිහීමක් නිරීක්ෂණය වූ අතර එම පිරිහීම කෙරෙහි ආදායම් ලැබීම් රු.122,625,176 කින් වැඩි වී තිබුණත් සංවර්ධන වියදම් රු.92,454,006 කින්, පරිපාලන වියදම් රු.41,950,171 කින් හා මූල්‍ය පිරිවැය රු.788,232 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

මණ්ඩලය විසින් ඉන්දියාවේ චෙන්නායි ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳසැල් 05 කින් අයවිය යුතු එකතුව රු.7,079,858 ක් වූ කඩකුලී හා විදුලිය ගාස්තු අයකර ගැනීමට අධිකරණවල නඩු 05 ක් ගොණුකර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

2012 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වැඩසටහන් හා ව්‍යාපෘති යටතේ වූ කාර්ය සාධනය පහත පරිදි විය.

(අ) රජයේ අයවැය යෝජනා වැඩසටහන්

| වැඩසටහන | භෞතික කාර්ය සාධනය | | | මූල්‍ය කාර්ය සාධනය | | |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කගත ව්‍යාපෘති ගණන/කාර්යයන් | සම්පූර්ණ කල ව්‍යාපෘති ගණන/ කාර්යයන් | කාර්ය සාධනයේ ප්‍රතිශතය | අයවැයගත ප්‍රතිපාදනය | තථ්‍ය උපයෝජනය | මූල්‍ය උපයෝජනයේ ප්‍රතිශතය |
| | | | සියයට | රු.මිලියන | රු.මිලියන | සියයට |
| (i) ඒකාබද්ධ කෘෂි ආදර්ශ වැඩසටහන | 100 | 06 | 06 | 500.0 | 75.6 | 15 |
| (ii) අපනයන කෘෂි කලාප | | | | | | |
| ➢ අම්පාර අන්නාසි වගා ව්‍යාපෘතිය | අක්කර 200 ක අන්නාසි මොරෙයියන් 1,200,000 කින් යුත් වගා ස්ථාපනය කිරීම | අන්නාසි මොරෙයියන් 174,401 කින් අක්කර 52 ක වගා ස්ථාපනය කිරීමෙන් අනතුරුව ව්‍යාපෘති කටයුතු | 26 | 16.2 | 2.0 | 12 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | අක්‍රියව තිබුණි. | | | | |
| ➢ බිංගිරිය ඇන්තූරියම් මල් හා කැපූ විසිතුරු ශාක පත්‍ර සැකසුම් පැලැටි වගා ව්‍යාපෘතිය | (i) සිමෙන්ති මල් බඳුන් 50,000 ගොවීන්ට සැපයීම. | ප්ලාස්ටික් හා නයිලෝන් බඳුන් 15,000 ක් පමණක් ගොවීන්ට සපයා තිබුණි. | 08 | 24.8 | 27.6 | 111 |
| | (ii) ඇන්තූරියම් මල් 124,000ක් වාර්ෂිකව අපනයනය කිරීම | මල් අපනයනය කර තිබුණේ 2011 හා 2012 වර්ෂවලදී පිළිවෙලින් 10,400 ක් හා 15,475 ක් පමණකි. | | | | |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඒකාබද්ධ කෘෂි ආදර්ශ වැඩසටහනේ ඉලක්කගත ව්‍යාපෘති 100 න්, ආරම්භ කර තිබුණේ ව්‍යාපෘති 24 ක් පමණි. ඉන් 18 ක් අසාර්ථක වී අත් හැර දමා තිබුණි.

(ii) අපනයන කෘෂි කලාප වැඩසටහනේ බිංගිරිය ඇන්තූරියම් මල්වගා ව්‍යාපෘතිය වෙනුවෙන් යෝජිත නිෂ්පාදන එකතුකිරීමේ, ඇසුරුම් කිරීමේ හා අපනයන සැකසුම් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන සඳහා වූ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු 2012 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(iii) අපනයන කෘෂි කලාප වැඩසටහනේ අම්පාර අන්නාසි වගා ව්‍යාපෘතියේ අන්නාසි මොරෙයියන් සැපයීම කළ කොන්ත්‍රාත්කරු සැපයීම් පැහැර හැර තිබුණු හෙයින් වගා ස්ථාපන ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී තිබුණි. කෙසේ නමුත් පැහැර හැරීම සම්බන්ධයෙන් සිදුවූ හානිය සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ගයක් 2013 සැප්තැම්බර් වන විටත් ගෙන නොතිබුණි.

(ආ) අපනයන ප්‍රවර්ධන සහ සංවර්ධන වැඩසටහන්

| | අංශය | භෞතික කාර්ය සාධනය | | | | | මූල්‍ය කාර්ය සාධනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉලක්කගත වැඩසටහන් ගණන | අවලංගු කළ හෝ අත්හිට වූ වැඩසටහන් ගණන | ප්‍රමාණවත් පරිදි සම්පූර්ණ නොකළ වැඩසටහන් ගණන | සම්පූර්ණ කළ වැඩසටහන් ගණන | කාර්ය සාධන ප්‍රතිශතය | අයවැයගත ප්‍රතිපාදනය | තථ්‍ය මූල්‍ය උපයෝජනය | උපයෝජනයේ ප්‍රතිශතය |
| | | | | | | සියයට | රු.මිලියන | රු.මිලියන | සියයට |
| (i) | කාර්මික නිෂ්පාදන | 34 | 03 | 08 | 23 | 68 | 57.74 | 28.77 | 50 |
| (ii) | කෘෂිකර්ම හා ධීවර නිෂ්පාදනය | 40 | 05 | 14 | 21 | 53 | 65.84 | 37.35 | 57 |
| (iii) | අපනයන සේවා | 22 | 04 | 08 | 10 | 45 | 27.80 | 9.62 | 35 |
| (iv) | අලෙවි සංවර්ධන | 23 | 01 | 04 | 18 | 78 | 49.80 | 25.57 | 51 |
| (v) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන | 36 | 23 | - | 13 | 36 | 81.40 | 7.80 | 10 |
| (vi) | අනෙකුත් අපනයන සේවා | 42 | 07 | 14 | 21 | 50 | 30.69 | 14.95 | 49 |
| (vii) | විශේෂ ව්‍යාපෘති | 04 | 01 | 01 | 02 | 50 | 99.61 | 132.17 | 133 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (viii) | අනෙකුත් විශේෂ ව්‍යාපෘති | 06 | 03 | 01 | 02 | 33 | 51.36 | 14.95 | 29 |
| | එකතුව | 207 | 47 | 50 | 110 | | 464.24 | 271.18 | 58 |

(ඇ) විදේශ වෙළඳපල ප්‍රදර්ශන
-------------------------------

අපනයන ප්‍රවර්ධන වැඩසටහන් යටතේ 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය අතර කාලපරිච්ඡේදය තුළදී විදේශ වෙළඳ ප්‍රදර්ශන 05 ක් වෙනුවෙන් රු. මිලියන 61.16 ක් වැයකර අපනයන සමාගම් 85 ක් සහභාගී කර තිබුණද, අපනයන ප්‍රවර්ධනයට දායක වී තිබුණේ ඉන් අපනයන සමාගම් 11 ක් පමණකි. මේ අනුව, අපනයන ආදායම වර්ධනය කිරීමෙහිලා, විදේශ වෙළඳපල ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් සහභාගී කරවීම ඵලදායී අන්දමින් සිදු වී නොතිබුණි.

(ඈ) දේශීය වෙළඳ ප්‍රදර්ශන

----------------------------

රු.මිලියන 156.6 ක් වැයකර පවත්වා තිබුණු " ශ්‍රී ලංකා එක්ස්පෝ - 2012 " ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය සඳහා විදේශ ගැණුම්කාර සමාගම් 1507 ක් හා දේශීය අපනයන සමාගම් 299 ක් සහභාගී කර තිබුණද, එක්සත් ජනපද ඩොලර් මිලියන 66 ක ඇනවුම් සඳහා එකඟතාවය හෝ ලැබී තිබුණේ විදේශීය ගැණුම්කාර සමාගම් 15 කින් අපනයන සමාගම් 12 කට පමණකි. කෙසේ වෙතත්, 2013 අප්‍රේල් 30 දින වන විට වර්ෂයකට වැඩි කාලයක් ගත වී තිබුණද, ඇනවුම් කිසිවක් එකී සමාගම් වෙත ලැබී නොතිබුණු හෙයින් අපනයන අවස්ථා කිසිවක් උදා වී නොතිබුණි. මේ අනුව, වෙළඳ ප්‍රදර්ශනය පැවැත්වීම තුළින් අපේක්ෂා කරන ලද අපනයන ආදායම වර්ධනයට ඉන් දායකත්වයක් ලැබී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

(අ) මණ්ඩලය විසින් "ඒකාබද්ධ කෘෂි ආදර්ශ", "කෘෂි කලාප" යනාදී අපනයන ප්‍රවර්ධන වැඩසටහන්වල ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ ඇගයීම හා සමාලෝචනය සඳහා වූ පසු විපරම් කටයුතු ඉටු කිරීම වෙනුවෙන් නිර්නායක සහ පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි. මේ නිසා මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන්වලින් අපනයන ප්‍රවර්ධනය කර තිබුණේද යන්න පිළිබඳ සෑහීමට පත් විය නොහැක.

(ආ) විවිධ අපනයන ප්‍රවර්ධන වැඩසටහන් යටතේ ස්ථාපනය කළ පෞද්ගලික සමාගම් 66 ක කොටස් විෂයයෙහි කළ රු. 163,370,567 ක් වූ ආයෝජනවල පැවැත්ම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාගම් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ අපනයන ප්‍රවර්ධන වැඩසටහන්වලට අදාලව ඉලක්කගත අරමුණු සාක්ෂාත්වීම හෝ අසාර්ථකවීම මත ක්‍රියාකාරීත්වය ඇනහිට අක්‍රීයව පවතින සමාගම් 37 ක ආයෝජනය කර තිබුණු රු.85,975,869 ක් වූ මුදල් ආපසු අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සමාගම් 29 ක රු.77,394,698 ක් ආයෝජනය කිරීම පිළිබඳව පසු විපරම් හා ක්‍රියාකාරීත්වය පිළිබඳ වාර්තා යාවත්කාලීන කර නොතිබුණු අතර, ක්‍රියාකාරී සමාගම්වලින් පවා ආයෝජිත මුදලට ප්‍රතිලාභ ලබා ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(iii) ආයෝජනවල පැවැත්ම හා වටිනාකම පිළිබඳව නිසි ඇගයීම්, තක්සේරු කිරීම් හා සමාලෝචනය කිරීමෙන් තොරව සමාගම් 53 ක කොටස් විෂයෙහි කළ ආයෝජන වටිනාකම් සම්පූර්ණයෙන්ම හීනවීම් වෙනුවෙන් අවිධිමත් ලෙස ගිණුම්වල රු.122,822,417 ක් වූ ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඇ) ඌව පරණගම හරිතාගාර ව්‍යාපෘතිය යටතේ එළවළු වගාකිරීම සඳහා හරිතාගාර 600 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද , ඉන් හරිතාගාර 100 ක් පමණක් ආරම්භ කර තිබුණි. ඉතිරි හරිතාගාර 500 ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමාණවත් පියවර නොගෙන ව්‍යාපෘති කටයුතු අවසන් කර තිබුණි. තවද ගිවිසුම් ගත කොන්දේසි පරිදි හරිතාගාර 100 ඉදි කිරීම සඳහා ඌව පරණගම ගොවීන්ට ගෙවූ රු.මිලියන 5 ක් වූ ණය මුදල් ගොවීන්ගෙන් ආපසු අයකර ගෙන මහා භාණ්ඩාගාරයට ගෙවීමේ වගකීම මණ්ඩලයට පැවරී තිබුණද එම වගකීමද මණ්ඩලය ඉටුකර නොතිබුණි.

(ඈ) අපනයනකරුවන් සඳහා ක්‍රියාත්මක කළ ණය ආධාර වැඩසටහන යටතේ ගෙවූ ණය වලින් අපනයනකරුවන් 166 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.46,486,856 ක් වූ ණය

---

වාරික අයකර ගැනීම් ක්‍රමවත්ව , කාර්යක්ෂමව හා කාලීනව ක්‍රියාත්මක නොකිරීම නිසා වර්ෂ 15 කට වැඩි කාලයක් තිස්සේ හිඟහිට තිබුණි. අපනයනකරුවන් 141 දෙනෙකුගෙන් රු.35,256,093 ක් වූ හිඟහිටි ණය අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබූණු ණය 21 කට අදාල රු.6,818,449 ක් වූ හිඟ ණය ගෙවීමට අපනයනකරුවන්ට අධිකරණ තීන්දු ලබාදී තිබුණද ණය අයකර ගැනීම් පිළිබඳ කඩිනම් පියවර නොගැනීම නිසා ඉන් හිඟහිටි ණය 16 කට අදාල අපනයනකරුවන් හිඟ ණය ගෙවීම් පැහැර හැර තිබුණි. එසේ තිබියදී රු.45,477,591 ක් වූ ණය ශේෂය අය කර ගත නොහැකි ලෙස සලකා බොල් ණය සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඉ) අපනයන කෘෂිකලාප වැඩසටහනේ අම්පාර දිස්ත්‍රික්කයේ අන්නාසි වගා ව්‍යාපෘතියේ මුරුසි අන්නාසි මොරෙයියන් 1,200,000 ක් මිලදී ගැනීම් කොන්ත්‍රාත්තුව සඳහා කාර්ය සාධන සුරක්ෂණයක්ද ලබා නොගෙන රු.4,500,000 ක අත්තිකාරම් මුදලක් 2009 වර්ෂයේදී ගෙවා තිබුණද, ඉන් සපයා තිබුණේ අන්නාසි මොරෙයියන් 174,401 ක් පමණි. ඒ අනුව ගිවිසුම්ගත කොන්දේසි කඩකර තිබීම හා ගිවිසුම් කාලය ඉකුත් වීම මත අයකර ගත යුතු රු.3,191,993 ක් වූ ඉතිරි අත්තිකාරම් මුදල 2013 මැයි 31 දින වන විටද අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

3.3 හඳුනාගත් පාඩු

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හම්බන්තොට බටඅත කර්මාන්ත වැඩසටහනේ සම්භාණ්ඩ කර්මාන්ත ව්‍යාපෘතිය සඳහා රු.1,000,000 ක් ආයෝජනය කර ස්ථාපිත කළ පුද්ගලික සමාගමේ කටයුතු ආරම්භ කිරීම අත්හැර දමා තිබුණු බැවින්, සමාගමේ කටයුතු ආරම්භක අවස්ථාවේදීම අක්‍රීය වී ආයෝජනය කළ මුදල් මණ්ඩලයට අහිමි වී තිබුණි.

(ආ) මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය නඟා සිටුවීම සඳහා රු.2,400,000 ක් ආයෝජනය කර ස්ථාපිත කළ පෞද්ගලික සමාගමේ කටයුතු අක්‍රිය වීම මත 2012 වර්ෂයේදී විසුරුවා හැර තිබුණෙන්, එම ආයෝජන මුදලින් මණ්ඩලයට ලැබී තිබුණේ රු.1,000,000 ක් පමණකි.

## 3.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව මණ්ඩලය සතු වාහන 05 ක් සහ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 04 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ සේවයට 2007 වර්ෂයේ සිට අනුයුක්ත කර තිබුණු අතර මණ්ඩලය 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලය තුළදී වාහන නඩත්තු වියදම් සහ කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා සඳහා පිළිවෙලින් රු.3,694,779 ක් හා රු.4,498,295 ක් වශයෙන් එකතුව රු.8,193,074 ක් මණ්ඩලයේ අරමුදලින් වැයකර තිබුණි.

## 3.5 කාර්ය මණ්ඩල සංයුතිය

මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලයේ තත්ත්වය පහත පරිදි විය.

| සේවක මණ්ඩල වර්ගීකරණය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| තෘතීයික | 14 | 11 | 03 |
| ද්විතීයික | 193 | 156 | 37 |
| ප්‍රාථමික | 75 | 63 | 12 |
| එකතුව | 282 | 230 | 52 |

විධිමත් අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු වෙනුවෙන් කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් /සේවකයින් 10 දෙනෙකු බඳවාගෙන 2012 දෙසැම්බර් 31 දිනට වැටුප් හා දීමනා වශයෙන් රු. 2,403,935 ක් ගෙවා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කර තිබුණද, විගණන කටයුතු ක්‍රියාත්මක කිරීම දුර්වල තත්ත්වයක පැවතිණි. කෙසේ වෙතත්, අභ්‍යන්තර විගණනයෙන් වාර්තා කර තිබුණු අඩුපාඩු සම්බන්ධයෙන් ද මණ්ඩලයේ අවධානය යොමුකර නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.2 අයවැය ලේඛනමය පාලනය

2012 වර්ෂයේ අයවැය ලේඛනයට අනුව අපනයන සංවර්ධන වියදම් හා පුනරාවර්තන වියදම් සඳහා වූ ඇස්තමේන්තු ගත වියදම පිළිවෙලින් රු.මිලියන 468.7 ක් හා රු.මිලියන 259.7 ක් වුවද, වර්ෂය අවසානයට තථ්‍ය වියදම පිළිවෙලින් රු.මිලියන 332.2 ක් හා රු. මිලියන 306.4 ක් වූයෙන්, තථ්‍ය වියදම, අයවැය ලේඛනගත ප්‍රතිපාදනයෙන් සියයට 71 ක් හා සියයට 118 ක් වී තිබුණි. ඒ අනුව අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානය යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ .

(අ) ගිණුම්කරණය

(ආ) ආයෝජන

(ඇ) ණය ආපසු අයකර ගැනීම

(ඈ) ආදායම් පාලනය

(ඉ) වත්කම් පාලනය

(ඊ) වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම

(උ) අයවැය පාලනය